සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

රජයේ භාෂා පරිවර්තක සේවයේ 1 වැනි පන්තියේ නිලධාරීන් සඳහා වන
කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2013 (2015)
அரசாங்க மொழிபெயர்ப்பாளர் சேவையில் வகுப்பு I இன் அலுவலர்களுக்கான
வினைத்திறன்காண் தடைப் பரீட்சை - 2013 (2015)
Efficiency Bar Examination for Officers in Class 1 of the Government Translators' Service - 2013 (2015)

## 1 - (I) සිංහලෙන් දෙමළ බසට පරිවර්තනය

පැ තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- දෙමළ භාෂාවට පරිවර්තනය කරන්න.

1. සේවක අර්ථසාධක අරමුදල ශ්‍රී ලංකාවේ ඇති විශාලතම සමාජ ආරක්ෂණ ක්‍රමයයි. එය විශ්‍රාම වැටුප් හිමිකම් නොලබන පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතුවූවන්ගේ විශ්‍රාම දිවියෙහි සුරක්ෂිතතාව අරමුණු කරගනිමින් ඊට අත්වැලක් වන්නට පිහිටුවන ලද්දේ ය. එය සේව්‍ය සේවක දෙපාර්ශ්වයේම අනිවාර්ය දායකත්වයෙන් යුත් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ක්‍රමයක් ලෙස පිහිටුවා ඇත. ඒ, 1985 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ය. එහෙත් ඊට දස වසරකටත් පෙර සර් අයිවර් ජෙනිංස්ගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද සමාජ සේවා කොමිසම 1947 දී අර්ථසාධක අරමුදලක් පිහිටුවිය යුතු යැයි නිර්දේශ කර තිබුණත් එය ක්‍රියාවට නැංවී නොතිබිණි. කෙසේ වෙතත් 1958 දී අර්ථසාධක අරමුදලක් පිහිටුවීම පිළිබඳ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද්දේ එවකට නිවාස හා සමාජ සේවා අමාත්‍යවරයාව සිටි ටී.බී. ඉලංගරත්න මහතා විසිනි. මේ සම්බන්ධයෙන් 1958 නොවැම්බර් 21 දින නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ පළමු නියෝගය අනුව සේවක අර්ථසාධක අරමුදලට සේව්‍ය සේවක දෙපාර්ශ්වය විසින් සේවකයාගේ මාසික ඉපැයීම්වලින් පිළිවෙළින් සියයට 6 ක් සහ 4 ක් ලෙස මාසිකව දායක මුදල් ගෙවිය යුතු බවට නියම කෙරිණි.

   විශ්‍රාම වැටුප් හිමිකම් නොලබන අතිවිශාල පිරිසකට ජීවිතයේ සැඳෑ සමය අගහිඟකමින් තොරව ගත කිරීම සඳහා සේවාවසානයේ ප්‍රතිලාභ ලබාදෙන සේවක අර්ථසාධක අරමුදල, 1958 දෙසැම්බර් 01 දින සිට ආයතන 54 ක් විෂයෙහි බලාත්මක කිරීමෙන් පිහිටුවන ලදී. කෙසේ වෙතත් සේවක අර්ථසාධක අරමුදල් පිහිටුවීමේ අරමුණු පසුකාලීනව පනතට ගෙන එන ලද සංශෝධන සහ නියමයන් මගින් තවදුරටත් පුළුල් වී තිබේ. ඒ අනුව,

   (i) 1978 අංක 8 දරන පනත් සංශෝධනයෙන් සේව්‍යයා හා සේවකයා පිළිවෙළින් සේවකයාගේ මුළු ඉපැයීම්වලින් මාසිකව සියයට 9 ක් සහ 6 ක් ලෙස අරමුදලට දායක විය යුතු බවට නියම කර ඇත.

   (ii) 1981 අංක 26 දරන පනත් සංශෝධනයට අනුව සේව්‍යයා හා සේවකයා පිළිවෙළින් මාසිකව අරමුදලට දායක විය යුතු අරමුදල සේවකයාගේ මුළු ඉපැයීම්වලින් සියයට 12 සහ 8 ක් ලෙස නියම කර තිබේ. වර්තමානයේ අවම දායක මුදල ලෙස පවතින්නේ මෙම අනුපාතයයි.

   (iii) 1988 අංක 42 දරන පනත් සංශෝධනයෙන් අර්ථසාධක අරමුදලේ සාමාජිකයාගේ ශේෂය ඇපයට තබා අනුමත බැංකුවකින් නිවාස ණයක් ලබා ගැනීමට විධිවිධාන සැලසිණි.

   (iv) 2012 අංක 2 දරන පනත් සංශෝධනයෙන් නිවාස කටයුත්තක් වෙනුවෙන් හෝ සාමාජිකයාගේ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා හෝ තම කේවල ගිණුමේ පවතින ශේෂයෙන් සියයට 30 ක ප්‍රමාණයක් නිදහස් කිරීමට පහසුකම් සලසා තිබේ. මෙම පහසුකම ක්‍රියාත්මක කරවීමේ ක්‍රමවේදය මේ වන විට සැකසෙමින් පවතී.

   මේ අනුව මෙම අරමුදලේ නිර්මාතෘවරුන්ගේ අරමුණ වඩා පුළුල් හා ශක්තිමත් පදනමකින් ක්‍රියාත්මක කරලීම පිණිස පසුගිය වසර 54 තුළ සාධනීය පියවර කිහිපයක් ගෙන ඇති බව පෙනේ.

2. (අ) ශ්‍රී ලංකාවේ අලංකාර වෙරළ, නොගැඹුරු මුහුද, වටිනා සංස්කෘතික උරුමයන්ගෙන් සහ අනෙකුත් සම්පත්වලින් යුක්ත වූ, අලුතින් නිදහස් වූ නැගෙනහිර සහ උතුරු පළාත්, රටේ සංචාරක කර්මාන්තයේ වර්ධනය සඳහා උදා වූ වටිනා අවස්ථා ලෙස සැලකිය හැකි වේ. මේ අනුව සංචාරකයන් හට උතුරු හා නැගෙනහිර පළාත්වල සංචාරය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කළ යුතු වේ. එම ප්‍රදේශවල යටිතල පහසුකම් කඩිනමින් දියුණු කිරීම සඳහා රජයේ මෙන්ම පෞද්ගලික අංශයේ සහභාගිත්වය ද ඉතා වැදගත් වේ. එසේම මාර්ග හා

[ 2 වැනි පිටුව බලන්න.

ප්‍රවාහන පහසුකම් කිසිසේත් සංචාරක කර්මාන්තයේ ඉදිරි පිම්මට ප්‍රමාණවත් නොවන අතර, දැනට යෝජිත මෙන්ම ආරම්භ කොට ඇති නොයෙකුත් යටිතල පහසුකම් සංවර්ධන කටයුතු හැකි ඉක්මනින් සම්පූර්ණ කළ යුතු ය. ගුණාත්මක පොදු ප්‍රවාහන සේවා පහසුකම් පහසුවෙන් ලබාගැනීමට හැකිවන අයුරින් ප්‍රධාන පිවිසුම් මාර්ගවලට බස් රථ, දුම්රිය සේවා සම්බන්ධ කළ යුතු අතර එම මාර්ග වැඩි දියුණු කළ යුතු ය. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය සම්පූර්ණයෙන් නිම කළ පසු යම්තාක් දුරකට එම මාර්ගයේ දැනට පවතින මාර්ග තදබදය අඩු වනු ඇති අතර දිවයිනේ සියලු පළාත්වලට පහසුවෙන් පිවිසිය හැකි අයුරින් සියලුම මාර්ග විශේෂයෙන්ම සංචාරකයන් ආකර්ෂණය කර ගන්නා ප්‍රදේශවල මාර්ග පුළුල් විය යුතු ය.

වර්තමානයේ දී ජාත්‍යන්තර වශයෙන් ගත් විට සංචාරක කර්මාන්තය ඉතා පුළුල් පරාසයක විසිර පවතී. ශ්‍රී ලංකාවේ අපේ උරුමය, සැණකෙළි, සුන්දර දර්ශන, අපට ආවේණික දේශීය ශරීර සුවතා ක්‍රම, ක්‍රීඩා හා ත්‍රාසය මුසු ක්‍රීඩා, පිරිසිදු වෙරළ තීරය, වන උරුමය සහ වන සතුන් යන තේමා 8 ක් යටතේ සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සිදු කෙරෙමින් පවතී. කෙසේ වුව ද, පාරිසරික සහ ත්‍රාසජනක ක්‍රීඩා ආදිය ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය වී ඇත්තේ සුළු වශයෙනි. පාරිසරික සංචාරක ව්‍යාපාරය ගත් විට, කුරුල්ලන් නැරඹීම, ඇවිදීම සහ වන ජීවී සංචාර සඳහා ශ්‍රී ලංකාව ඉතා සුදුසු ස්ථානයක් වේ. එසේම ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සඳහා ආයුර්වේද සංචාරක වෙළෙඳපොළ වර්ධනය කිරීම සඳහා අවස්ථා රාශියක් ඇත. එසේම ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් බොහෝවිට කාණ්ඩ වශයෙන් පැමිණෙන අතර, තනි පුද්ගලයන් වශයෙන් (Individual Tourism) ශ්‍රී ලංකාවේ සංචාරය කරන පිරිස ඉතා අල්ප ය. නමුත් සංචාරක කර්මාන්තය දියුණු මට්ටමක පවතින බොහෝ රටවල් තනි පුද්ගල වශයෙන් පැමිණෙන සංචාරකයින් ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගෙන ඇත.

(ආ) සිංහල අවුරුදු නිවාඩු කාලයෙහි තාත්තා මා ගමට නො කැඳ වූ බැවින් සති හතරක් පමණ දික් වූ නිවාඩු කාලය මා ගත කළේ ධර්මසිංහ මහතාගේ ගෙදරම ය. ඔහුගේ දරුවන් දෙදෙනා නිසා නොවේ නම් නිවාඩු කාලය එහි ගත කිරීම, පාළු ගෙයක ජීවත්වීම වැනි අමාරු කාරියක් වන්නේ ය.

ධර්මසිංහ මහතාගේත් ඉස්කොලේ හාමිනේගේත් ජීවිතය අපට පෙනුණේ සන්තෝෂයෙන් තොර වූ ගතානුගතික එකක් ලෙසිනි. ගුඩු කරනු පිණිස දුමෙහි දමන ලද පොල් ගෙඩිය, කිසිවකුගෙන් අතගෑමක් පවා නො ලැබ, නොසෙල් වී එක තැනම සිටියි. දවස් පතා පාසලට ගොස් එක විදියේ පාඩම් උගන්වා ගෙදරට ඇවිත් රෑ බත් කා නිදන්ට යන තෙක් 'ඕක කරන්න එපා; හයියෙන් සිනාසෙන්න එපා; සතුන් අල්ලන්න එපා' යි අපට අවවාද කිරීමත් තුඹස් බඳින වේයකු මෙන් මුදල් එකතු කිරීමත් රුපියල් පහක් පවා අනිකකුට දෙන්ට පෙර තුන් හතර වරක් ගැණ බැලීමත් හැර සන්තෝෂ විය හැකි අනික් කාරියක් නොකරන ධර්මසිංහ මහතාගේ ජීවිතය ද අපට පෙනුණේ ගුඩුපොල් ගෙඩියක් ලෙසිනි.

නිවාඩු කාලයෙහි මම දෙතුන් දවසකට වරක් ගෙදරින් පිටව ගොස් මගේ අනික් යහළු ළමයින් සමග හති වැටෙන තෙක් සෙල්ලම් කෙළෙමි. ගුණදාස ඔවුන් හා සෙල්ලමට නොගියේ තම පියා ඉඩ නුදුන් හෙයිනි. සෙල්ලම් කරනු පිණිස මා ගෙදරින් පිට යනු වැළැක්වීමට ධර්මසිංහ මහතා වෑයම් නො කළේ මා ගෙදර සිටියොත් සෝමලතාත් ගුණදාසත් අඬගාගෙන සෙල්ලමට ගොස් මේස පුටු පෙරළා පිඟානක් කෝප්පයක් බිඳිති යි සිතූ නිසා විය යුතු ය.

අලුත් අවුරුද්ද නිමිත්තෙන් ධර්මසිංහ මහතාගේ ගේ අලෙවි කෙළේ වෙළෙන්දෙකි. එය 'අලුත් අවුරුද්දට ගනුදෙනු කිරීම' යන නමින් ද හැඳින්වෙන සිරිතකි. පැරණි සිරිත් අනුව අලුත් අවුරුද්ද සිහිකරන ධර්මසිංහ මහතා ඇතුළු අප කවුරුනුත් අලුත් අවුරුදු බත කෑවේ අතුරන ලද පැදුරුවල වාඩි වී කෙසෙල් කොළවල ය. අප සුබ මොහොතින් අවුරුදු බත කා ටික වේලාවක් ගිය පසු ගනුදෙනු කරනු පිණිස වෙළෙන්දා පැමිණියේ ය. කිරිබත් පිඟානක් හා කැවිලි පිඟන් ද සහිත මේසය ළඟ වූ පුටුවෙහි හිඳගත් ඔහු, කිරිබත් පිඩක් ගුළි කොට දැල්වෙන තිරයක් ඇති පොල් තෙල් පහනෙහි දමා ඒ බත් ගුළිය ළඟ සතයක් ද තැබී ය. අනතුරුව ඔහු බුලත් කොළයෙහි දවටන ලද රිදී කාසියක් සහිත තඹ කාසිය බැගින් අප සියලු දෙනාටම දුන්නේ ය. ධර්මසිංහ මහතාත් ඉස්කෝලේ හාමිනේත් සත පහේ කාසියකුත් සමග රුපියලේ රිදී කාසිය බැගින් එදින වෙළෙන්දා අතින් ලැබූ බව මම පසුව දැනගත්තෙමි. වෙළෙන්දා බුලත් කොළයෙහි දවටා දෙන ලද පඬුර ධර්මසිංහ මහතා තමාගේ අල්මාරියෙහි සඟවා තැබුවේ ය. ඉස්කෝලේ හාමිනේ ද තමාගේ පඬුර තමාගේ අල්මාරියෙහි මුල්ලක තැබුවේ, ධාතු නිදන් කෙරෙන කල දැක්වෙන භක්තියටත් සැලකිල්ලටත් නොදෙවෙනි භක්තියක් හා සැලකිල්ලක් දක්වමිනි. අල්මාරියට වැඩමවීමට පෙර ඈ ඒ පඬුරට සුවඳ දුම් ඇල්ලුවා දැයි මම නො දනිමි. අනික් අවුරුද්ද ලබන තෙක් ඔවුන් ඒ පඬුරුවලට අත නොගසන බව කියනු මට අසන්නට ලැබිණි.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved]*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

රජයේ භාෂා පරිවර්තක සේවයේ 1 වැනි පන්තියේ නිලධාරින් සඳහා වන
කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2013 (2015)
அரசாங்க மொழிபெயர்ப்பாளர் சேவையில் வகுப்பு I இலுள்ள அலுவலர்களுக்கான
வினைத்திறன் காண் தடைப் பரீட்சை - 2013 (2015)
Efficiency Bar Examination for Officers in Class 1 of the Government Translators' Service - 2013 (2015)

## 1 - (II) සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය

පැ. තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන්න.

1. මතභේදයට තුඩු දී ඇති උමා ඔය ව්‍යාපෘතිය පිළිබඳව සකස් කළ විශේෂඥ වාර්තා දෙකකින් වර්තමානයේ දී එම ව්‍යාපෘතිය පිළිබඳව පැනනැගී ඇති ප්‍රශ්න සඳහා විසඳුම් ඉදිරිපත් කර ඇති අතර, අනාගතයේ දී පැනනැගිය හැකි නිෂේධාත්මක බලපෑම් අඩු කර ගැනීම සඳහා ගතයුතු පියවර පිළිබඳ නිර්දේශ ද ලබා දී ඇති බව පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් පවසන ලදී.

වාර්තා දෙකින් එකක්, මධ්‍යම පරිසර අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිලධාරින් හා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනඥයින් පිරිසකගෙන් සමන්විත වූ කාරක සභාවක් විසින් ද අනෙක, මධ්‍යම පරිසර අධිකාරිය විසින් තනිවම ද සකස් කර ඇත.

පාරිසරික සැලැස්මකට අනුකූල නොවීම නිසා ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත්කරුවන් විසින් විශාල හානියක් සිදු කර ඇති බව පිළිගන්නා අතර ව්‍යාපෘතිය දිගටම ක්‍රියාත්මක කිරීමට තවමත් හැකියාවක් ඇති බව පැවසූ ලේකම්තුමා, වැඩිදුරටත් කියා සිටියේ ව්‍යාපෘතියේ වරදක් නැති බවත් වික්ටෝරියා වැනි වෙනත් ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ද සමාන ප්‍රශ්න පැන නැගුණ බවත් ය. වාර්තාවලින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම, උමා ඔය ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ කොන්ත්‍රාත්තුව ලබාදුන් "FARAB බලශක්ති හා ජල ව්‍යාපෘති සමාගම" නමැති ඉරේනියන් සමාගම සතු ය.

පරිසරය නිරීක්ෂණය කිරීමේ සැලැස්මක් පිළියෙල විය යුතු බව ද මහජනතාව ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ හොඳින් දැනුවත් වන බව සහතික කර ගැනීම පිණිස සමාජයීය මට්ටමින් කාරක සභා පිහිටුවිය යුතු බව ද ඉහත කී වාර්තාවලින් නිර්දේශ කර තිබේ. කෙසේ නමුත් ව්‍යාපෘතිය නිසා ජල හිඟයකට මුහුණපා සිටින බණ්ඩාරවෙල ප්‍රදේශයේ ජනතාවට අඛණ්ඩව ජලය සැපයුමට ඇති හැකියාව පිළිබඳව සැලකිල්ල යොමුවී ඇත. දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් දිනකට වතුර ලීටර 180 000 බැගින් ජල හිඟයට මුහුණ පා ඇති ප්‍රදේශවලට බෙදා හරිනු ලැබේ.

47% පමණ ප්‍රමාණයක් වැඩ නිමවා තිබූ උමා ඔය ව්‍යාපෘතිය මහජනතාව මුහුණ දී ඇති ප්‍රශ්න සැලකිල්ලට ගෙන මෙම වසරේ පෙබරවාරි මස මැද සිට තාවකාලිකව නවතන ලදී. 2014 වර්ෂයේ දී උමඟ හෑරීම පටන්ගත් පසු බණ්ඩාරවෙල හා ඇල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසවල ළිං සිඳීමට පටන් ගත්තේය.

2. (අ) (i) අධිකාරිය සතු බලතල

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදන කිරීම;

(ආ) ස්වකීය කර්තව්‍යය ඉටු කිරීම සඳහා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි නියම කොන්දේසි මත, ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම;

(ඉ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීම සහ ස්වකීය කර්තව්‍යය ඉටු කර ගැනීම සඳහා ඒවා යොදා ගැනීම;

(ඊ) ස්වකීය කර්තව්‍යය සාර්ථකව ඉටු කර ගැනීම පිණිස අනුකමිටු පත් කර ගැනීම හෝ පළාත් මට්ටමේ ඒකක සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම;

[ දෙවන පිටුව බලන්න.

(උ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුබසාධක සහ විනෝද පහසුකම් සැපයීම;

(ඌ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍යය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි, ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් බාහිරව සියලු ගිවිසුම්වලට ඇතුළත්වීම හා ඒවා ඉටුකිරීම;

(එ) සාමාන්‍යයෙන් අධිකාරියේ කටයුතු නිසි පරිදි ඉටු කිරීම පහසු කරලීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම;

(ii) කිසිම තැනැත්තෙකු විසින් දුම්කොළ ප්‍රචාරක දැන්වීමක් හෝ මද්‍යසාර පිළිබඳ ප්‍රචාරක දැන්වීමක් පළ කිරීම, පළකරනු ලැබීමට සැලැස්වීම හෝ පළ කිරීම සඳහා බලය දීම නොකළ යුතුය.
'පළකිරීම' යන්නෙන් පහත දැක්වෙන දෑ ඇතුළත් වේ.

(අ) ප්‍රචාරක දැන්වීම හෝ ප්‍රචාරක දැන්වීමේ ඇතුළත් කිසිවක් මහජනයාට ප්‍රවේශ විය හැකි කිසියම් ස්ථානයකින් හෝ වාහනයකින් දර්ශනය කිරීම, තිරගත කිරීම හෝ වාදනය කිරීම;

(ආ) මහජනතාවට ලබාගත හැකි පරිදි හෝ බෙදා හරිනු ලබන ප්‍රවෘත්ති පත්‍රයක, සඟරාවක, වැඩසටහනක, පත්‍රිකාවක හෝ අත් පත්‍රිකාවක ප්‍රචාරක දැන්වීමක් ඇතුළත් කිරීම;

(ඉ) මහජනයා විසින් හෝ මහජනතාවගෙන් කොටසක් විසින් නරඹන හෝ ශ්‍රවණය කරනු ලැබීමට අරමුණු කරන චිත්‍රපටියක, වීඩියෝ පටයක, ගුවන් විදුලි වැඩසටහනක හෝ රූපවාහිනී වැඩසටහනක හෝ අන්තර්ජාලය තුළ ප්‍රචාරක දැන්වීමක් ඇතුළත් කිරීම;

(ඊ) ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීමක ඇතුළත් කිසිවක් මහජනතාවට විකිණීම, කුලියට දීම හෝ සැපයීම හෝ විකිණීම, කුලියට දීම හෝ සැපයීම සඳහා ඉදිරිපත් කිරීම;

(iii) මහජනතාවට ප්‍රවේශ විය හැකි ප්‍රදේශවල දුම්පානය කිරීම වරදක් බව:

(අ) යම් කොටු කරන ලද පොදු ස්ථානයක් ඇතුළත කිසියම් තැනැත්තෙකු විසින් යම් දුම්කොළ නිෂ්පාදන භාවිත කිරීම හෝ යම් තැනැත්තෙකුට එසේ කිරීමට ඉඩදීම නොකළ යුතුය.

(ආ) යම් කොටු කරන ලද පොදු ස්ථානයක අයිතිකරුවකු, පදිංචිකරුවකු, කළමනාකරුවකු හෝ භාරකරුවකු හෝ එම ස්ථානය භාරව සිටින්නෙකු ඒ කොටු කරන ලද ස්ථානය ඇතුළත දුම්කොළ නිෂ්පාදන කිසිවක් භාවිත කරමින් දුම්පානය නොකරන බවට සහතික විය යුතුය.

2. (ආ) ඓතිහාසික වශයෙන් බලන කළ අපේ අධ්‍යාපනය ඇති වූයේ බෞද්ධ දූත පිරිස් පැමිණීමේ ප්‍රතිඵලයක් වශයෙන් බව මහාවංශය විස්තර කරයි. එහෙත් අපේ ඓතිහාසික පුරාවෘත්තවල අනුරාධපුරයේ බ්‍රාහ්මණයන්, ජෛනයන් සහ වෙනත් ආගමික කණ්ඩායම් සිටි බවට සාක්ෂි තිබේ. ක්‍රිස්තු පූර්ව නවවන ශත වර්ෂයේ දී පමණ අනුරාධපුරය සරුසාර නගරයක්ව පැවති බවට පුරාවිද්‍යාඥයෝ සාක්ෂි ඉදිරිපත් කරති. ඒ අනුව අපේ අධ්‍යාපනය බෞද්ධ දූත පිරිස් පැමිණීමට පෙර සිට ම පැවති බව පෙනී යයි. කෙසේ නමුත්, බෞද්ධ දර්ශනය අපේ රටට මෙන් ම ආසියාවේ සෙසු රටවලට ද ශක්තිමත් පදනමකින් යුත් අධ්‍යාපන දර්ශනයක් සැපයූ බවට සැකයක් නැත. බෞද්ධාගම මගින් සියලු දෙනාට අධ්‍යාපන අවස්ථා සපයන ලදී. ඒ බටහිර යුරෝපයේ ප්‍රොතෙස්තන් ක්‍රිස්තියානි අධ්‍යාපනය ඇතිවීමට ශතවර්ෂ ගණනාවකට පෙර ය.

අධ්‍යාපනය කිසිදු බලපෑමකින් තොරව ලංකාවේ වැඩිදියුණු විය. අපේ ඓතිහාසික ලේඛන, වෙනත් සාහිත්‍ය කෘති, ශිලාලේඛන ඇතුළු පුරා විද්‍යාත්මක තොරතුරු හා සීගිරි ගී මගින් දැක්වෙන්නේ පුරාණයේ දිවයිනේ සියලු ම ප්‍රදේශවල පාහේ බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන පැවති බවයි.

අනුරාධපුරයේ පිහිටා තිබූ මහා විහාරය, අභයගිරිය, ජේතවනය වැනි විශ්ව විද්‍යාල හා දකුණු ප්‍රදේශයේ පිහිටා තිබූ සෙසු උසස් අධ්‍යාපන ආයතන ඈත කාලයක සිටම ආසියාවේ බොහෝ ප්‍රදේශවල ප්‍රසිද්ධියට පත්ව තිබිණි.

ශ්‍රී ලාංකික මෙන්ම විදේශීය උගත්තු දේශයේ මෙන්ම විදේශවල ද ජීවත් වූ උගතුන්ගේ ඇසුර ලැබීම සඳහා සංචාරයෙහි යෙදුණහ. ක්‍රිස්තු වර්ෂ පළමුවන ශතවර්ෂයේ දී ථෙරවාදී බුද්ධ ධර්මය පුස්කොළ පොත්වල ලියන ලදී. ඒ අවධියේ අප රට පිහිටි කීර්තිමත් අධ්‍යාපන ආයතන, ආසියාවේ රටවල් රාශියක ම පාලි හා බෞද්ධ ධර්මය ප්‍රචාරය කරන ප්‍රධාන මධ්‍යස්ථාන විය. ගතවූ දශක පහ තුළ කරන ලද පර්යේෂණවලින් හෙළිවන තොරතුරුවලට අනුව මේ කාල පරිච්ඡේදයේ පැවති අධ්‍යාපන ආයතනවල ශාස්ත්‍රීය තත්ත්වය හා පෘථුලභාවය ඉතා ඉහළ මට්ටමක පැවති බව පෙනේ.

* * *